**ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 22 දින ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 394.08 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 391.70 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 2.38 ක් හෙවත් සියයට 0.60 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 314.03 | 312.65 | 1.38 | 0.44 |
| මූලධන | 80.05 | 79.05 | 1.00 | 1.25 |
| **එකතුව** | **394.08** | **391.70** | **2.38** | **0.60** |

2.2 **ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා එකතුව රු.මිලියන 45.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.මිලියන 36.97 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 82.16 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේත | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 20.02.01.03 | 45.00 | 36.97 | 8.03 | 17.84 |

**2.3** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 28601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 16.20 | 16.09 | 14.20 | 15.76 | 70.00 | 52.63 |

**2.4** **අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0042/0015/000 දරන අග්‍රිම ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 23.07 ක් විය.

**2.5** **පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 4 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 71.92 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0068/000 | 0.64 |
| 6000/0000/00/0016/0020/000 | 68.49 |
| 6000/0000/00/0018/0025/000 | 2.63 |
| 6000/0000/00/0001/0006/000 | 0.16 |
| එකතුව | 71.92 |

**2.6 විගණන නිරීක්ෂණය**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/ 2002/ 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.2 පොදු තැන්පත් ගිණුම්**

වර්ෂ 3 ක සිට 6 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන එකතුව රු.66,210,414 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3 ආදායම් ගිණුම**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේතයක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 20:02:01:03 දරන ආදායම් සංකේතය - ඉඩම් හා අනෙකුත් බදුකුලී ආදායම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට අනුව ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 50 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට

රු.මිලියන 36.97 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 74 ක් වී තිබුණි.

(ii) 2015 වාර්ෂික ඇස්තමේන්තුවේ ආදායම ලෙස රු.මිලියන 50 ක් ඇස්තමේන්තු කර තිබුණද, ආදායම් ගිණුමෙහි එය රු.මිලියන 45 ක් වශයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) ඉකුත් වර්ෂය ආරම්භයේ හිග ආදායමට අනුරූපීව රැස්කළ ආදායමේ ප්‍රමාණය සියයට 28 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ එය සියයට 11 ක්ව පැවතුණි. ඒ අනුව 2015 වර්ෂයේ ශුද්ධ ආදායම පහත වැටීම කෙරෙහි හිග ආදායම් රැස්කිරීමේ දුර්වලතා හේතු වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය අවසානයට හිග ආදායම රු. මිලියන 22.34 ක් වූ අතර ඉකුත් වර්ෂයේ හිග ආදායම රු. මිලියන 20.28 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 15 කින් හිග ආදායම සමාලෝචිත වර්ෂයේදී වැඩි වී තිබුණි. තවද වර්ෂ 03 ඉක්මවූ හිග ආදායම රු. මිලියන 4.56 ක් වූ අතර, වර්ෂ 1 ක සිට වර්ෂ 2 ක් දක්වා කාලයක සිට පැවැත එන හිග ආදායම රු. මිලියන 13.50 ක් වී තිබුණි.

(v) ආදායම් එකතු කිරීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත්, ආදායම් එකතු කිරීමට අදාළ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතීම හේතුවෙන් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල හතක රු. මිලියන 19.04ක හිග ආදායම් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සංචලනය නොවී පැවතුණි.

(vi) මුදල් රෙගුලාසි 85 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, බදු ඉඩම් සම්බන්ධ නිවැරදි තොරතුරු නොතිබීම නිසා ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම විධිමත් පදනමක් මත සිදු කර නොතිබුණි.

### 3.4 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසදුම් ප්‍රකාශය

විෂය අංක 28601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 2.90 ක් වී තිබුණි. එම හිගහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 26 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

**දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.**

(අ) **වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් එක් වාහනයක් වර්ෂයකට අධික කාලයක සිටද, ඉඩම් අමාත්‍යාංශයට අයත් වාහන 9 ක් වර්ෂ 1 ½ ක සිට වර්ෂ 7 ක් දක්වා කාල පරාසයක සිටද, දෙපාර්තමේන්තුව විසින් භාවිතා කර තිබුණු නමුත් එම වාහන විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන රු.මිලියන 3.15 ක බැරකම් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයට අදාළ රු. 88,548 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ සඳහන් කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 6 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.මිලියන 2.46 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

**3.6 අනුකූල නොවීම**

------------------

**නීතී රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

**-----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 1179 | 1,931,326 | වෛද්‍ය නිලධාරින් හැර වෙනත් කිසිදු නිලධාරියෙකුට තම මාසික වැටුප ඉක්මවා දීමනා ලබා ගැනීමට නොහැකි වුවද, දෙපාර්තමේන්තුවේ නිලධාරින් තිදෙනෙක් සඳහා වාර්ෂික ඒකාබද්ධ වැටුප ඉක්මවා බිම්සවිය දිරිදීමනා ගෙවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104 (4) | 182,202 | 2013, 2014 සහ 2015 වර්ෂවලදී අනතුරට ලක් වූ වාහන 3 ක් සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 31 දින වන විටත් පූර්ණ වාර්තා සකස් කර නොතිබුණි. |

## 3.7 කාර්යසාධනය

----------------

2015 ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයෝජන ව්‍යාපෘති හා යටිතල පහසුකම් ආදිය සඳහා සුදුසු ඉඩම් අක්කර 5000 ක් හඳුනා ගැනීමටත්, ආයෝජන ව්‍යාපෘති හා යටිතල පහසුකම් සඳහා ලබා දුන් ඉඩම් කට්ටි 35 ක පසු විපරම් කටයුතු සිදු කිරීමටත් ඉලක්ක කර තිබුණද, එය ඉටුකර නොතිබුණි.

(ආ) පහත ක්‍රියාකාරකම් හි අපේක්ෂිත ඉලක්කයන් ලගාකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(i) බිම්සවිය වැඩසටහන යටතේ දීමනා පත්‍ර ලබාදීම, ත්‍රිවිධ හමුදා හා පළාත් පාලන ආයතනවලට පැවරුම් නියෝග නිකුත් කිරීම, නියාදන සාධන පත්‍ර නිකුත් කිරීම, මධ්‍යම පාන්තික දීමනා පත්‍ර නිකුත් කිරීම යන කාර්යයන්හි ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය පිළිවෙලින් සියයට 47 ක්, 57 ක්, 51 ක් හා 36 ක් වී තිබුණි.

(ii) හිඟ බදු ආදායම් අය කරගැනීම සහ පුහුණු වැඩමුළු පැවැත්වීම යන ක්‍රියාකාරකම් 2 හි ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය සියයට 17 ක් වී තිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්කයන් වෙනස් කිරීමේදී පිළිගත හැකි නිශ්චිත ක්‍රමවේදයකට අනුව එය සිදු කර නොතිබුණු අතර, එම ඉලක්කයන් වෙනස් කිරීමට අදාළ අනුමැතිය ලබා දුන් තීරණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

--------------------

සංචාරක හෝටල් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිලාවේලි කඹුරුපිටිය ප්‍රදේශයේ පිහිටි ඉඩම් කොටසක් දීර්ඝ කාලීන බදු පදනම මත පෞද්ගලික ආයතනයකට බදු දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව පදනම් කරගෙන වාර්ෂික බදු මුදල හා වසර තුනක වාර මුදල පිළිවෙලින් රු. මිලියන 2.10 ක් හා රු. මිලියන 6.30 ක් වශයෙන් එකතුව රු.මිලියන 8.40 ක් එකවර ගෙවීමෙන් පසු ඉඩමේ භුක්තිය බදු ගැනුම්කරු වෙත පැවරිය යුතු වුවත්, මෙම බදු මුදල් අය කිරීමෙන් තොරව අවිධිමත් ලෙස ඉඩමේ භුක්තිය 2010 දෙසැම්බර් මාසයේදී භාරදී තිබුණි.

(ආ) අවස්ථා කීහිපයකදීම විවිධ හේතු ඉදිරිපත් කරමින් බදු මුදල් ගෙවීමේ කාලය දීර්ඝ කර දෙන ලෙස ඉල්ලුම්කාරිය විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් ඉල්ලුම් කර තිබුණු අතර, අවස්ථාවන් කීහිපයකදීම එම සහනය ලබා දීමට ඉඩ දී තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් රජයට අයවිය යුතු රු. මිලියන 21.73 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 අගෝස්තු 29 දින බදුකරු විසින් රු.400,000 ක් පමණක් ගෙවා තිබුණු අතර, ඉන් අනතුරුව කිසිදු බදු මුදලක් ගෙවීමෙන් තොරව ඉඩම භුක්ති විද තිබුණි. 2015 වර්ෂයේදී ඉඩම් අමාත්‍යවරයාට කරන ලද අභියාචනයක් මත නැවතත් ඉඩම තක්සේරු කර තක්සේරුව අඩු කිරීම මත ගෙවිය යුතු වාර්ෂික බදු මුදල රු. මිලියන 2.10 සිට රු.මිලියන 1.78 ක් දක්වා අඩුකරගෙන තිබුණු අතර ඒ මත අයකරන පොලියද අඩු කර තිබුණත් එම ආයතනය දිගින් දිගටම බදු මුදල් ගෙවීම පැහැර හැර තිබුණි.

(ඈ) ඉඩම් ආඥා පනතේ 86 වගන්තිය, ඉඩම් නියෝග 212 හා 1996 අගෝස්තු 01 දිනැති අංක 96/5 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව රාජසන්තක කළ ඉඩම්

සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. එම ඉඩම්වල කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු නොකර රජයේ දේපලක් වර්ෂ 6 කට ආසන්න කාලයක් අනිසි ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන්ද කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

දෙපාර්තමේන්තුව සතු නිල නිවාස සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 312 කින් නිවාස 95 ක් එනම් සියයට 30 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) ඉහත නිල නිවාස 312 කින් 37 ක අනවසර පදිංචිකරුවන් සිටින අතර එම අනවසර පදිංචිකරුවන් නිල නිවාසවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නිල නිවාස 22 ක් අළුත්වැඩියා කළ නොහැකි අන්දමින් විනාශ වී තිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 50 | 36 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 38 | 13 | 25 |
| (iii) | ද්විතියික මට්ටම | 678 | 443 | 235 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 134 | 99 | 35 |
| | **එකතුව** | **900** | **591** | **309** |